







# කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ඉන්දියාවේ මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් සමාගම් උපායමාර්ගික ව්‍යාපාරික සහයෝගීතාවයකට එළඹේ

## ශ්‍රී ලංකාවේ නාවුක කර්මාන්තය ශක්තිමත් කිරීම සහ ජාතික ආර්ථිකයේ වර්ධනය

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම නැව් ඉදිකිරීම සහ නැව් අලුත්වැඩියා කිරීමේ ආයතනය වන, කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගම ඉන්දියාවේ නාවික සහ වාණිජ යාත්‍රා ඉදිකිරීමේ විශේෂඥ සමාග මක් වන මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් සමග ඓතිහාසික උපායමාර්ගික ආයෝජන ගිවිසුමකට එළඹුන බව නිවේදනය කරන ලදී.**

නාවුක කර්මාන්තයේ ප්‍රමුඛතම නම් දෙකක් ලෙස ගැනෙන ''ජාතියේ නැව් ගොඩනැගුම්කරුවන්'' ලෙස සාඩම්බරයෙන් හැඳින්වෙන මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් සහ ''ශ්‍රී ලාංකීය කාර්මීකරණයේ පෙර ගමන්කරු'' වන කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගම එක්ව ශ්‍රී ලංකාවේ කාර්මිකරණ ප්‍රයත්නය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

ඉන්දියානු සහ විදේශීය වෙළෙඳපොළ සඳහා තාක්ෂණිකව දියුණු සහ උසස් තත්ත්වයේ නැව් තනන්නෙකු ලෙස මැසග න් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය මහත් කීර්තියක් උසුලයි. මෙම සමාගම ඉන්දියාවේ ජාතික කොටස් වෙළඳපොළේ සහ බොම්බේ කොටස් වෙළඳපොළේ ගනුදෙනුකාර ආයතනයක් වන අතර, එය ඉන්දියානු රජයේ ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයන්, මෙහෙයුම් කාර්යක්ෂමතාවයන් සහ මූල්‍ය ස්වාධීනත්වයන් පෙන්නුම් කරන තෝරාගත් රාජ්‍ය අංශයේ ව්‍යවසායන් සඳහා පිදෙන ''නවරත්න'' සම්මානයෙන්ද පිදුම් ලබා ඇත.

මෙම සහයෝගීතාවය ශ්‍රී ලංකාවේ නාවුක ක්ෂේත්‍රයේ උන්නතිය හා සංවර්ධනයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන අතර එමගින් කලම්බු ඩොක්යාඩ් පීඑල්සී ආයතනයට සහ රටටද එකලෙස ප්‍රතිලාභ හිමි වනු ඇත.

කලම්බු ඩොක්යාඩ් පීඑල්සී ආයතනය 1974 දී රාජ්‍ය ව්‍යවසායකත්වයක් ලෙස ආරම්භ කරන ලදී. කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව, ආරම්භ කරන ලද 125,000 DWT ධාරිතාවයකින් යුත් වියළි තටාකය ඉදිකිරීම සඳහා යෙදවිය යුතු අධික ප්‍රාග්ධන වියදම සහ එකල පැවති අභියෝගාත්මක සාර්ව ආර්ථික පරිසරය හේතුවෙන්, දිගින් දිගටම සමාගමේ වර්ධනයට බාධාවක් වූ වැඩිවන ණය අර්බුදයට පිළියමක් වශයෙන්, සමාගම 1993 දී පුද්ගලීකරණය කරන ලදී. එම පුළුල් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ පියවරක් ලෙස, ශ්‍රී ලංකා රජය සිය කොටස් වලින් 51% ක් ජපානයේ ඔනොමිචි ඩොක්යාඩ් ආයතනයට පවරන ලද්දේ ඔවුනට 1993 සිට පළමු වසර 5 තුළ ශ්‍රී ලංකා රජයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ඩොක්යාඩ් සමාගමේ කොටස් කිසිවක්, කිසිදු පාර්ශ්වයකට පැවරිය නොහැකි බවට කොන්දේසියක්ද සහිතවය.

පසුගිය වසර කිහිපය තුළ ඇතිවූ නැව් නිෂ්පාදනයේ වෙළඳපොළ තත්ත්වයන්, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්19 වසංගතය, යුරෝපීය උද්ධමනය, ශ්‍රී ලංකාවේ බලශක්ති අර්බුදය, රටේ බංකොලොත්භාවය, අසාමාන්‍ය පොලී අනුපාත සහ උද්ධමනය යනාදියෙහි අහිතකර බලපෑම හේතුවෙන් සමාගමද දැඩි මූල්‍ය අස්ථාවරත්වකට මුහුණ දුන්නේය. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්වාධීන විගණක වාර්තාවේ ඉස්මතු කරන ලද අඛණ්ඩ පැවැත්ම පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් සමාගමේ කොටස්, 2024 ජුනි 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළඳපොළේ නිරීක්ෂණ ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

ඔනොමිචි සමාගම විසින් 2024 නොවැම්බර් 25 වන දින තමන් එළඹ සිටි කළමනාකරණ ගිවිසුම අවසන් කිරිමෙන් අනතුරුව සිය බහුතර කොටස් හිමිකාරීත්වයෙන්ද ඉවත් වීමට ගත් තීරණයට පසුව, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉතිරි සාමාජිකයන් ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සහතික කිරිම උදෙසා ඉදිරියටද කටයුතු කිරීමට යෝජනා සම්මත කර ගන්නා ලදී.

ඉන්පසු කලම්බු ඩොක්යාඩ් ආයතනය විසින්, ඔනොමිචි සමාගම සතු 51% ක කොටස් මිලදී ගැනීමට සහ ප්‍රාග්ධනය යෙදවීම හරහා ආයතනය පුනර්ජීවනය කළ හැකි නව ආයෝජකයෙකු සෙවීම ආරම්භ කරන ලදී. ඉහත 51% ක විකුණුම් කොටස් සම්පූර්ණයෙන්ම පුද්ගලික අයිතියක් ඇති ඒවා වන අතර රජය හෝ කිසිදු රජයේ ආයතනයක් විසින් ඒවායේ හිමිකාරිත්වයක් නොදරන බවට සමාගම විසින් තහවුරු කරයි. විවෘත හා තරගකාරී තේරීම් ක්‍රියාවලියකට අනුව, විදේශීය සහ දෙස් විදෙස් සන්ධානගත උනන්දුවක් දක්වන පාර්ශ්වයන් 40 කට ආසන්න සංඛ්‍යාවකින් ලැබුණු කැමැත්ත ප්‍රකාශ කිරීම් සහ යෝජනා පිළිබඳව, ආයෝජන විශේෂඥයින් විසින් කරන ලද ගැඹුරු ඇගයීමකින් පසුව, සමාගම විසින් වඩාත්ම සුදුසු උපායමාර්ගික ආයෝජකයා ලෙස මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය තෝරා ගන්නා ලදී. මෙහිදී මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අතිශය සාධනීය එකක් වූ අතර එය සමාගමේ උපායමාර්ගික දිශානතිය සහ ශ්‍රී ලංකාවේ නාවුක කර්මාන්තයේ ඉදිරි දැක්ම සමගද වඩාත්ම සමපාත වූවකි. කලම්බු ඩොක්යාඩ් සමාගමේ නැවත ප්‍රකෘතිමත් කිරිම සහ තිරසර වර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත්, තාක්ෂණික විශේෂඥතාව සහ සනාථ කරන ලද ශක්‍යතාවයන් මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය සතුව ඇති බව සමාගමේ අදහසයි. 2025 ජුනි 27 වන දින මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උපරිමය ඇමරිකානු ඩොලර් මිලියන 52.96 ක් දක්වාවූ ආයෝජනයක් අනුමත කරන ලදී. එය නිර්ණය කර ඇත්තේ සමාගමේ අපේක්ෂිත හිමිකම් නිකුතුව යටතේ දායක වී ඇති සියලුම කොටස් සඳහා සලකා බැලීම මෙන්ම, ඔනොමිචි ඇතුළු සියලුම කොටස් හිමියන් සතු කොටස් හා අයිතිය ලබාගැනීමට මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය විසින් දෙන ලද යෝජනාව පිළිගන්නේ නම් එවිට සමාගමේ පවතින සියලුම කොටස් සඳහාද ආවරණය විය හැකි පරිද්දෙනි. මෙම ක්‍රියාවලිය සමාගමේ පවතින කොටස් හිමියන්ගේ ප්‍රාථමික දායකත්වය මෙන්ම ද්විතීයික අත්පත් කර ගැනීම යන අංශ දෙකෙහිම එකතුවකින් සමන්විත වනු ඇත. මෙහිදී අදාළ ක්‍රමවේදය සමාගම යථාතත්වයට පත්කිරිම සඳහා අවශ්‍ය වන අරමුදල් සම්පාදනය කරගත හැකි වන පරිද්දෙන්, ඉතා ප්‍රවේශම් සහගතව හා ක්‍රමවත්ව සකසන ලද්දකි. මෙම ගනුදෙනුව සුළුතර කොටස් හිමියන්ගේ ආරක්ෂාවද මැනවින් තහවුරු වන අයුරින් සම්පාදනය කර ඇත.

මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතාවය මගින් සමාගමේ තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු වීම, එහි නිෂ්පාදන පරාසය පුළුල් වීම සහ කලාපීය සහ ගෝලීය නැව් නිෂ්පාදන වෙළඳපොළවල තරගකාරිත්වය වැඩිදියුණු කිරීමට නියමිතය. මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනයේ දියුණු තාක්ෂණය සහ ඔප්පු කරන ලද නැව් නිෂ්පාදන ක්‍රියාවලීන් උපයෝගී කර ගැනීමෙන්, සමාගමට එහි පහසුකම් නවීකරණය කිරීම වේගවත් කළ හැකි අතර එහි සේවා පිරිනැමීම් වැඩිදියුණු කළ හැකිය.

මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතාවය මගින් ඩොක්යාඩ් සමාගමට ඉන්දියානු සාගර කලාපයේ ප්‍රධාන තරඟකරුවෙකු ලෙස ස්ථානගත වීමට හැකි වන බවත්, කලාපීය වෙළඳාම සහ නාවුක ප්‍රතිපත්තිය තුළ ඉන්දියාවේ සීඝ්‍ර වර්ධනයත් සමග ඇති වන ප්‍රවණතාවලින් ප්‍රතිලාභ ලැබිය හැකි බවත්, ඉන්දියාවේ ආර්ථික ක්ෂේත්‍රයට වඩාත් ගැඹුරින් ඒකාබද්ධ වීමට සමාගමට උපකාරී වන බවත්, ඉන්දියානු සහ ගෝලීය නාවුක ව්‍යාපෘතිවලට සහභාගී වීමට සහ එහි ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථා විවෘත කරන බවත් සමාගම අවධාරණය කරනු ලබයි.

### ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ

**ජාතික ආර්ථිකයට සවියක්:**
මෙම සහයෝගීතාවය ශ්‍රී ලංකා නාවුක ප්‍රතිපත්ති වලට අනුකූලතාවය, සහාය දීම, වැඩිදියුණු කිරීම සහ අනාගත උපායමාර්ගික වර්ධනයන් සඳහා මග පාදනු ඇත. මෙම උපායමාර්ගික සන්ධානය නව රැකියා අවස්ථා උත්පාදනය කරන අතරම ආසන්න වශයෙන් 3000 ක් පමණ සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කරන අතර නාවුක අංශය තුළ ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් ලබා දෙනු ඇත.

**තාක්ෂණ හුවමාරුව සහ කුසලතා සංවර්ධනය:**
මෙම සහයෝගීතාවය දැනුම හුවමාරුව සහ විශේෂිත පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සපයනු ඇති අතර, ශ්‍රී ලාංකික ශ්‍රම බලකායේ කුසලතාවන් වැඩිදියුණු කිරීම සහ නාවුක කර්මාන්තයේ නවෝත්පාදනයන් පෝෂණය කරනු ඇත. මෙම සහයෝගීතාවය මගින් සමාගමට ශ්‍රී ලංකාවේ ජාතික පුහුණු අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට හැකි වන අතර එමගින් රටේ නාවුක හා ඉංජිනේරු අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා ජාතික විශ්ව විද්‍යාල, වෘත්තීය හා තාක්ෂණික පුහුණු ආයතන සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා ලබා දෙනු ඇත. එමගින් දේශීය හා කලාපීය තරුණ තරුණියන් නාවුක කර්මාන්ත අවශ්‍යතා සඳහා පුහුණු කිරීම සහ සහතික කිරීම සඳහා තාක්ෂණික පුහුණු ඇකඩමියක් පිහිටුවීමට සහ සංවර්ධනය කිරීමට හැකි වන අතර එමගින් සමාගමේ සහ ශ්‍රී ලංකා නාවුක කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලනු ඇත.

**සමුද්‍රීය ආරක්ෂාව සහ යටිතල පහසුකම්:**
මෙම සහයෝගිතාවය ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා සමාගමේ හැකියාවන් මෙන්ම සහ ස්වෛරීභාවයද තවදුරටත් ශක්තිමත් කරනු ඇත. මෙමගින් ආයතනයට නැව් තැනීමේ සහ නැව් අලුත්වැඩියා කිරීමේ සේවාවන් සම්බන්ධව ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතා ප්‍රමුඛතා පදනම මත සපුරාලීමට වඩා හොඳ හැකියාවක් ලැබෙනු ඇත. තවද, ශ්‍රී ලංකා රජයේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු තත්වයක් යටතේ, විදේශීය ආරක්ෂාවට අදාළ විදේශීය නැව් තැනීමේ ව්‍යාපෘති හෝ නැව් අලුත්වැඩියා කිරීමේ කාර්යයන් භාර නොගන්නා බවට සමාගම සහතික වේ.

**අපනයන අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම:**
මෙම සහයෝගීතාවය මගින් අප සමාගමට ව්‍යාපාරික ප්‍රජාව සමග සහ රාජ්‍ය ත්‍රාන්තික ව්‍යාපාරික අවස්ථා සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වීමට ඉඩ සැලසෙන අතර වටිනා අපනයන දිරිගැන්වීම් සහ සහනාධාර ලබා ගැනීමට අවස්ථාවන් උදා වනු ඇත. විශේෂයෙන්ම ඉන්දීය රජය සතු ආයතන විසින් නිකුත් කරන නැව් ගොඩනැගුම් සහ අලුත්වැඩියා කිරීමේ ටෙන්ඩර් සඳහා සුදුසුකම් සහ ප්‍රවේශය අප ආයතනය වෙත ලැබෙන අතර එමගින් සමාගමේ නිෂ්පාදන ක්‍රියාවලිය උපායමාර්ගිකව පෙළගැස් වීමට හැකියාව ලැබෙනු ඇත. මෙමගින් අප සමාගමට ඉන්දියානු/ජාත්‍යන්තර වෙළෙඳපොළවලට ඇතුළු වීමේ අවස්ථා තවදුරටත් පුළුල් වන අතරම නව මංපෙත් විවර කරමින් නැව් ගොඩනැගුම් සහ නැව් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති හරහා විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම මගින් ශ්‍රී ලංකාවේ අපනයන ආදායමද වැඩි දියුණු කිරීමට පිටුවහලක් වනු ඇත. තවද, මෙම සහයෝගීතාවය තුළින් අප සමාගමට ඉන්දීය රජයේ දිගුකාලීන දැක්ම සහ ප්‍රතිපත්ති මගින් ප්‍රතිලාභ ලබා ගැනීමටද අවස්ථාවන් උදා වනු ඇත.

නැව් ගොඩනැගුම් ධාරිතාව පුළුල් කිරීම, නවෝත්පාදන අවස්ථාවන් පෝෂණය කිරීම සහ ශක්තිමත් නාවුක යටිතල පහසුකම් පුළුල් කිරීම මගින් ඉන්දියානු රජයේ දිගුකාලීන දැක්මක් වන 2047 වසර වන විට ගෝලීය නාවුක ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු වීමේ අභිප්‍රාය උපායමාර්ගිකව උපයෝගී කර ගනිමින් අප සමාගමට නැව් ගොඩනැගුම් සහ නැව් අලුත්වැඩියා කිරීම යන දෙඅංශයෙන්ම නව ව්‍යාපාරික වර්ධන අවස්ථා රාශියක් ලගා කර ගත හැකිවේ මෙමඟින් අපනයන විභවයන් ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට අත්‍යවශ්‍ය විදේශ විනිමය ආදායම් ගෙන ඒමට හැකි වනු ඇත.

### කලම්බු ඩොක්යාඩ් පීඑල්සී වෙත ලැබෙන ප්‍රතිලාභ:

මෙම සහයෝගීතාවය තුළින් සමාගමට පහත සඳහන් ඍජු ප්‍රතිලාභ ලැබෙනු ඇත.

**රැකියා සුරක්ෂිතතාව:**
මෙම සහයෝගිතාවය මගින් ආයතනයේ සේවක රැකියා සුරක්ෂිතභාවය, සේවක යහපැවැත්ම, දැනට පවතින සියලු ප්‍රතිලාභ සහ බලාත්මක ප්‍රතිපත්තීන් හා රෙගුලාසී නොවෙනස් වන බව සහතික කරනු ඇත.

**කුසලතා සංවර්ධනය:**
මෙම සහයෝගිතාවය මගින් නැව් ගොඩනැගුම් සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පුහුණු වැඩසටහන්, නිපුණතා ප්‍රවර්ධනය සහ සහතික කිරීම්, වෘත්තීයමය සංවර්ධන අවස්ථා හරහා සමාගමේ සේවක කුසලතා සංවර්ධනයට සහාය වනු ඇත.

**වෙළඳපළ තත්ත්වයන් වැඩිදියුණු කිරීම:**
මෙම සහයෝගීතාවයෙන් කලාපයේ ප්‍රමුඛතම නැව් නිෂ්පාදකයෙකු ලෙස සමාගමේ තත්ත්වය තවදුරටත් ශක්තිමත් කරනු ඇති අතර, නව ව්‍යාපාර සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් ආකර්ෂණය කර ගනු ඇත. නව ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීම, සමාගමේ හැකියාවන් ශක්තිමත් කිරීම, වෙළඳපළ කොටස වැඩි කිරීම, ඉන්දීය රජයේ සහය සහ දිරිගැන්වීම් ලබා ගැනීම සහ ඉන්දීය වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමට සහාය වීම යනාදිය මගින් සමාගමේ සංවර්ධනය සඳහා මං පෙත් හෙළි කිරීම තුලින් මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් සමාගම ආයතනයට සහය වනු ඇත. මෙමගින් වත්මන් නියාමන සීමාවන්/බාධක ජය ගැනීමට සහ ඉන්දීය රජය සතු යාත්‍රා අලුත්වැඩියා කිරීම සඳහා බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඉඩ සලසනු ඇත.

**පුළුල් වන ව්‍යාපෘති අවස්ථා:**
ගෝලීය වශයෙන් මැසගන් ඩොක් ෂිප් බිල්ඩර්ස් ලිමිටඩ් සතුව පවතින ස්ථාවර සහ පුළුල් ව්‍යාපාරික සබඳතා ජාලය මගින් කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගමට නව ව්‍යාපෘති අවස්ථා රාශියක් විවර වන අතර එමගින් ව්‍යාපාරික වර්ධනය සහ තිරසාරභාවය ඉහළ යනු ඇත. එමෙන්ම පසුගිය කාලය තුළ නව ගොඩනැගුම් ව්‍යාපෘති අත්පත් කර ගැනීමට බාධකයක්ව පැවති කාරක ප්‍රාග්ධන හිගය විසඳා ගැනීමට අවශ්‍ය මූල්‍ය ශක්තිය මෙම නව ව්‍යාපාරික සහයෝගීතාවය තුළ කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගමට ලැබෙන බැවින් නව නැව් නිෂ්පාදන ගිවිසුම් අත්පත් කර ගැනීමට අවශ්‍ය මුදල් ආපසු ගෙවීමේ ඇපකාරීත්ව සහතික නිකුත් කිරීමේ බාධක ඉවත්ව යනු ඇත. මේ තුළ වඩාත් සංකීර්ණ සහ ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදන ව්‍යාපෘති අත්පත් කර ගැනීමට පුළුල් ඉඩකඩක් විවර වනු ඇත.

විශේෂයෙන්ම පසුගිය වකවානුව තුළ මුදල් ආපසු ගෙවීමේ ඇපකාරීත්ව සහතික නිකුත් කිරීමට පැවති බාධක හේතුවෙන් කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගම ව්‍යාපාරික වශයෙන් විශාල අභියෝග රාශියකට මුහුණ පාන ලදී. ශ්‍රී ලංකාව ආර්ථික බංකොලොත් භාවය ප්‍රකාශයට පත් කිරීම සමග බැංකු සහ මූල්‍ය අංශයේ දුර්වල වීම මත නව නැව් නිෂ්පාදන ගිවිසුම් සඳහා මූලික අත්තිකාරම් ගෙවීම් ලබා ගැනීම සඳහා වන පහසුකම් සැලසීමට අවශ්‍ය බැංකු ඇපකර ලබා ගැනීමට සමාගම අපොහොසත් විය. විශේෂයෙන් දේශීය බැංකු මගින් නිකුත් කරන ලද බැංකු ඇපකර ජාත්‍යන්තර සේවාදායකයන් හෝ මූල්‍ය ආයතන විසින් පිළිනොගැනීම මෙම අර්බුදයට හේතුව විය. තවද, බොහෝ දුරට රටේ ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම හේතුවෙන්, දේශීය බැංකු විසින් නිකුත් කරන ලද ඇපකර සඳහා ප්‍රතිඇපකර ලබා දීමට ද ජාත්‍යන්තර බැංකු පසුබට විය. කෙසේ වෙතත්, මැසගන් ඩොක් ෂිප්බිල්ඩර්ස් ලිමිටඩ් වැනි ශක්තිමත් ආයතනයක් සමග ඇති කරගත් උපායමාර්ගික සන්ධානය හරහා මෙම බාධක ජය ගනිමින් විශ්වාසයෙන් ඉදිරියට යාමට කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගමට හැකියාව ලැබෙනු ඇත.

**විශේෂඥතාව, පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන සඳහා ප්‍රවේශය:**
මෙම සහයෝගීතාවය මගින් අති නවීන නැව් තැනීමේ තාක්ෂණයන් සහ ඉහළම භාවිතයන් සඳහා වන ප්‍රවේශය ලබා දෙනු ඇත, එමෙන්ම, ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන මුලපිරීම් වෙත එළැඹෙමින් නාවුක තාක්ෂණය, යටිතල පහසුකම්, නවෝත්පාදන සහ තිරසර නැව් තැනීමේ භාවිතයන් මගින් ඉදිරියට යාමට සමාගමට සහය වනු ඇත. එමෙන්ම කෘත්‍රිම බුද්ධි ව්‍යාපෘති කිහිපයකටම මැසගන් ඩොක් ෂිප් බිල්ඩර්ස් සමාගම අවතීර්ණ වී ඇති බැවින්, අනාගත ප්‍රතිලාභ සඳහා මෙම පර්යේෂණ සහ සංවර්ධන උත්සාහයන් උපයෝගී කර ගැනීමේ අවකාශය පවතී.

**ඉන්දියානු සැපයුම් දාමයන් සමග ඒකාබද්ධ වීම:**
ඉන්දියානු සැපයුම් දාමයන් වෙත ප්‍රවේශ වීමත් සමග, පවතින ගෝලීය සැපයුම් දාම ජාලය පවත්වා ගනිමින් මිලකරණය සහ කාලරාමු යන දෙකෙහිම වඩා හොඳින් තරග කිරීමටත්, ගෝලීය තරගකාරිත්වයට මුහුණ දීමටත් සමාගමට හැකි වනු ඇත.

**තිරසර වර්ධනය:**
සමාගමට එහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ ආයෝජන සිදු කිරීමට හැකි වන අතර, එමගින් සමාගම තම දිගුකාලීන වර්ධනය සඳහා ස්ථානගත වනු ඇත.

**වෙළඳ නාම අනන්‍යතාවය:**
සමාගමේ සහ එහි අනුබද්ධිත සමාගම්වල වත්මන් වෙළඳ නාම සහ ලාංඡන එලෙසම පවත්වා ගනිමින් තම ස්ථාපිත ගනුදෙනුකරුවන් සමග ශක්තිමත් සබඳතා ඉදිරියටත් පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත.

ඉන්දීය රජයේ ප්‍රතිපත්ති සහ දිරිගැන්වීම් මගින් සහාය ලබන මැසගන් ඩොක් ෂිප් බිල්ඩර්ස් සමාගමේ සහයෝගීතාවය යටතේ අපගේ නැව් නිෂ්පාදන, නැව් අලුත්වැඩියා සහ බර ඉංජිනේරු ක්ෂේත්‍රය සුවිශේෂී වර්ධන අවස්ථා අත්පත් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ එමෙන්ම පුළුල් වෙළඳපළ ප්‍රවේශය, නියාමන වාසි සහ ඉහළ වටිනාකමක් ඇති දිගුකාලීන නිෂ්පාදන ඇණවුම් ලබා ගැනීමේ හැකියාව තුළින් සමාගම තරගකාරී වාසියක් ලබා ගනු ඇත. මීට අමතරව, ඉන්දියාවේ ජාතික සහ ජාත්‍යන්තර නාවුක ඉලක්ක සමග පෙළගැස්වීම සමාගමට වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින ගෝලීය නාවුක කර්මාන්තය තුළ ස්ථානගත වීමට සහ සමෘද්ධිමත් වීමට ඉඩ සලසයි.

මෙම සහයෝගීතාවය ප්‍රධාන වශයෙන් අපගේ ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍ර වන නැව් නිෂ්පාදන සහ නැව් අලුත්වැඩියා අංශවල ස්ථාවරත්වය සහ වර්ධනය සහතික කරනු ඇති අතර සේවක රැකියා සුරක්ෂිතභාවය, යහපැවැත්ම, වෘත්තීය සහ කුසලතා සංවර්ධනය සහතික කරනු ඇත. තවද, ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑමක් ඇති නොවන ආකාරයේ නිෂ්පාදන පරිසරයක් පවත්වා ගනිමින් අනාගත ලෝක ආර්ථිකය තුළ ප්‍රවේගකාරීව ස්ථානගත වන ඉන්දියානු නිෂ්පාදන ආර්ථිකයේ වාසිය අත්පත් කර ගැනීමට සමාගමට හැකි වනු ඇත.

මැසගන් ඩොක් ෂිප් බිල්ඩර්ස් සමාගම සතු විශේෂඥතා අත්දැකීම් සහ නවෝත්පාදනයන් සමග මෙම නව ගමන උද්යෝගිමත්ව ආරම්භ කිරීමට කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගම බලාපොරොත්තු වන අතර, මෙම නව ආයෝජකයාගේ ශක්තිමත් සහයෝගය සමගින් සමාගම විසින් ඉටු කරනු ලබන ප්‍රමුඛ කාර්යභාරයන් මෙන්ම ශ්‍රී ලංකාවේ නාවුක ක්ෂේත්‍රයේ සංවර්ධන උපාය මාර්ග සාර්ථක කර ගැනීමටද හැකි වනු ඇත.

**කලම්බු ඩොක්යාඩ් පීඑල්සී සමාගම විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය නිවේදනය**

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2025 ජූලි මස 07 වැනිදා සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී